# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඞකරණලදී.

නො. 6,920 — 1918ක්වූ ජනවාරි මස 18වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ඉඩම් විකිණීම්.

No. 3,105, S. P.—දකුණු දිසාවේ මහාඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1918ක්වූ පෙබරවාරි මස 22වෙනි දිනවූ සිකුරාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ බෙන්තර වලල්ලාවිටිකෝරළේ කොඩාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 14ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 9,962. ගම—බඹරවාන. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 4078 | කපුරුවත්තේපොල්ලැව්ව .. | අම්බලන්ගොඩ පදිංචි අනුවාස් පට බැදි ඉරීනේලිස් ද වාස් .. | බැද්ද .. | 2 3 21 | 60 |
| 4079 | එම .. | — .. | බැදද (විකුණන්නේ නෑ) | 1 0 27 | —* |
| | සිතියම 10,229. ගම—ගොඩාමුනේ. | | | | |
| 1 | පරගහපිටකැලේ .. | උහන්ඹිවිට පදිංචි ජයසිංහගේ පිංචෝ රීස් .. | සුළුබැද්ද .. | 1 0 13 | 75† |
| | සිතියම 10,251. ගම—පෝද්දිවල. අයිතිකමකියන්නා—පෝද්දිවල පදිංචි පී. එච්. දෙන් කිරිනේලිස් පොලිස් ඔපිසර්. | | | | |
| 1 | ඔලගොඩකරතුර .. | — .. | { වත්ත .. <br> { වැවිල්ල .. | 0 1 26 <br> — | 60 <br> 5 |
| | සිතියම 10,606. ගම—බඹරවාන. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 1 | කපුරුවත්තේකැලේ නොහොත් කොටියාවලදෙලකන්ද | අම්බලන්ගොඩ පදිංචි අනුවාස් පට බැදි ඉරිනේලිස් ද වාස් .. | බැද්ද .. | 4 0 23 | 80 |
| | සිතියම 10,673. ගම—ගොළුවාමුල්ල. | | | | |
| 1 | අන්නාසිගල්ගොඩහේන .. | අම්බලන්ගොඩ පදිංචි කාහින්ගෙ ගේ ඔන්දිරිස් සිල්වා .. | හේන .. | 0 1 24 | 62·50 |
| 3 | එම .. | එම .. | එම .. | 0 3 15 | 62·50 |
| | සිතියම 10,698. ගම—පිටිගල. මෙම ඉඩමට අයිතිකමකියන්නෙක් නැහැ. | | | | |
| 2 | මොරන්දිගොඩ .. | — .. | බැදද (විකුණන්නේ නෑ) | — | —‡ |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 3 | එම .. | පිටිගල පදිංචි ඒ. ඈම්. අන්දෙරිස් | බැද්ද .. | 1 0 5 | 62·50 |
| | සිතියම 10,698. ගම—පිටිගල. මෙම ඉඩමට අයිතිකමකියන්නෙක් නැහැ. | | | | |
| 4 | මොරන්දිගොඩ .. | — .. | බැදද (විකුණන්නේ නෑ) | — | —‡ |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 5 | එම .. | — .. | එම .. | 0 0 28 | —* |
| 6 | එම .. | පිටිගල පදිංචි ඒ. ඈම්. අන්දෙරිස් | බැද්ද .. | 1 0 7 | 62·50 |
| 7 | මොරන්දිගොඩදෙනිය .. | — .. | දෙනිය .. | 1 2 3 | 60 |
| 8 | මොරන්දිගොඩ .. | — .. | කැකිල්ල (විකුණන්නේ නැහැ) .. | 0 0 30 | —* |
| | අයිතිකමකියන්නා—පිටිගල පදිංචි ඒ. ඈම්. අන්දෙරිස්. | | | | |
| 9 | එම .. | — .. | { රබර් හිටවාපු .. <br> { වැවිල්ල .. | 0 0 12 <br> — | 60 <br> 55·50 |
| 10 | එම .. | — .. | { එම .. <br> { වැවිල්ල .. | 0 0 5 <br> — | 60 <br> 36 |

* තහනම් ඉඩම්. † මිනිරන් හෑරීමේ බලය ඇතුව රුපියල් 250යි. ‡ ආණ්ඩුව අයිතිකම් නොකියන ඉඩම.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වෂී 1918ක්වූ ජනවාරි මස 16වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

**No. 3,106, S. P.**—දකුණු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝග වල ප්‍රකාරයට වෂී 1918ක්වූ පෙබරවාරි මස 26වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ වැල්ලබඩපත්තු කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 10ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| සිතියම 2,117. ගම—පිනිකහන. අයිතිකම්කියන්න—රජසන්තක. | | | | | |
| 2730 | පහලවටතනේකුඹුරේහේන | ඩී. සී. ඩී. ඇස්. සෙනෙවිරත්න ගන්විදනේ | කුඹුර | 0 1 33 | 15 |
| සිතියම 10,183. ගම—බටපොල. | | | | | |
| 4835 | දූලිපොත්තේකන්දඅද්දරහේන | — | කුරුඳු | 0 0 11 | 50* |
| සිතියම 10,432. ගම—ගොඩගම. | | | | | |
| 2 | දික්දූලියේබැද්ද නොහොත් පැනිලිදලගකැලේ | බේරගොඩ පදිංචි කේ. බී. උදරිස් ද සිල්වා | බැද්ද | 1 0 38 | 50 |
| සිතියම 10,455. ගම—දකුණු මාගල. | | | | | |
| 3 | කැකිරීයේමානාන | කැකිරීයේ පදිංචි පී. එච්. සියනේරිසා | හේන | 0 3 1 | 50† |
| 4 | එම | එම | එම | 0 0 20 | 50† |
| සිතියම 10,462. ගම—ගොඩගම. | | | | | |
| 3 | මහගන්ගොඩකැලේ | විව්යාගොඩ පදිංචි විතුදුර අන්ද්‍රේරිස් | බැද්ද | 1 1 32 | 55‡ |
| සිතියම 10,732. ගම—මාවඩවිල. අයිතිකම්කියන්න—බලපිටියේ පදිංචි සෙනේරිස් සිල්ව මුනසිංහ. | | | | | |
| 1 | කැටපොලේවත්ත | — | පොල් / වැව්ල්ල | 0 0 28 / — | 80§ / 90 |
| අයිතිකම්කියන්න—මැදදුවගේ එන්ද්‍රිස්. | | | | | |
| 2 | මහනයිදුව | — | වත්ත / වැව්ල්ල | 1 0 5 / — | 80§ / 13 |
| අයිතිකම්කියන්න—රජසන්තක. | | | | | |
| 3 | එම | — | කරත්තපාර සහ බැද්ද (විකුනන්නේ නැහැ) | 0 2 10 | —‖ |
| මෙම ඉඩමට අයිතිකම්කියන්නෙක් නැත. | | | | | |
| 4 | එම | — | බැද්ද (විකුනන්නේනැහැ) | — | —¶ |
| අයිතිකම්කියන්න—රජසන්තක. | | | | | |
| 5 | එම | — | බැද්ද | 2 0 16 | 85§ |
| 6 | එම | — | අඩිපාර සහ බැද්ද (විකුනන්නේ නැහැ) | 0 0 9 | —‖ |
| 7 | එම | කුඹල්වැල්ලේ පදිංචි ජී. ඩී බෙන්ජමින් | බැද්ද | 4 0 4 | 85§ |
| අයිතිකම්කියන්න—රත්ගම පදිංචි ඩී. ජේ. ඩී. ඇස්. තිලකරත්න. | | | | | |
| 8 | පුන්චිනයිදුව | — | පැලපොල් (විකුනන්නේනැ) | — | —¶ |

* මිනිරන්හැරීමේ බලය ඇතුව රුපියල් 200යි. † මිනිරන් හැරීමේ බලය ඇතුව රුපියල් 150යි.
‡ මිනිරන් හැරීමේ බලය ඇතුව රුපියල් 155යි. § මිනිරන් හැරීමේ බලය ඇතුව රුපියල් 500යි.
‖ තහනම් ඉඩම්. ¶ ආණ්ඩුව අයිතිකම් නොකියන ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඒජන්ත උන්නාන්සේගෙන්ද, එවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1918ක්වූ ජනවාරි මස 16වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

ගාලු දිස්ත්‍රික්කේ මෙහි පහත සඳහන්වෙන මිනිරන් තිබෙන වාය කියා කල්පනාකර තිබෙන රජසන්තක ඉඩම්වල අවුරුදු පහක මිනිරන් හැරීමේ බද්ද ගාළු දිස්ත්‍රික්කේ ඒජන්ත උන්නාන්සේ විසින් ගාල්ලේ කච්චේරියේදී මෙහි පහත දක්වන කොන්දේසි පිට වෂී 1918ක්වූ මාර්තු මස 5වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 10 ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත.

(*a*) එම බද්ද ආණ්ඩුවෙන් පණවනලද නියෝගවලට සහ කොන්දේසිවලටත් යටත්ව අවුරුදු පහක්, අවුරුද්දට අක්කරයට රුපියල් 10 බැගින් බිම්බද්ද ගෙවන්ට ඕනෑවා පමණකුත්නොව අවුරුදු පහකට මිනිරන් හැරීම පිණිස හතරවෙනි තීරයේ සඳහන්කර තිබෙන තක්සේරු මුදලට හෝ ඊට වඩා ඉල්ලුම්කාරයින්ගෙන් වැඩි ඉල්ලුම්කාරයා ගැනුම්කාරයා වෙනවා ඇත. එකී කොන්දේසිවල පිටපතක් මේ කච්චේරියෙන් ලබාගන්ට පුළුවන.

(*b*) විකිණීම අවසානවුන වහාම වැඩි ඉල්ලුම්කාරයා කියන ලද අය ඉල්ලුම්කළ මුදලෙන් සියයට දහය වන මුදලක් ඔහු ප්‍රථම යම් මුදලක් කච්චේරියේ තබා තිබුනා හෝ නොතිබුනා හෝ ඒජන්ත උන්නාන්සේට නොගෙව්වොත් හෝ ඉහත පෙණෙන විකිණීමේ කොන්දේසි අත්සන් නොකළොත් ගැණුම්කාරයා නොවන්නේය.

(*c*) ගැණුම්කාරයා විකුණපු දින පටන් මාසයක් ඇතුළතදී ඉතුරු මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට ඕනෑය. එසේ නොකළොත් විකිණීම ස්ථිර නොවෙනවා පමණකුත්නොව ගෙවනලද සියයට දහයේ මුදලද ආණ්ඩුව සන්තක වෙනවා ඇත.

(*d*) නියමකර තිබෙන කාලය තුළදී එකී මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට යෙදුනොත් උන්නාන්සේ විසින් ගැණුම්කාරයාට නියම ෆෝර්මයේ බදු ඔප්පුවක් දෙන්ට යෙදෙනවා ඇත. ඔහු එවලේම එයින් පිටපතක් ඒජන්ත උන්නාන්සේට දෙන්ට ඕනෑය.

(*e*) ඒ ඉඩම් විස්තරකිරීමෙහි හෝ මැනීමෙහි යම් වැරැද්දක් පසුව දැනගන්ට ලැබුනා ඇද්ද ගැණුම්කාරයා විසින් ගත් මුදලෙන් අඩුකිරීමක් කරන්ට ආණ්ඩුව බැදී නැත.

(*f*) බදු ඔප්පුව සෑදීමේ ගාස්තුව මිලේටගත් මුදලෙන් සියයට හතර බැගින් රුපියල් 20ට වැඩිනොවන ගණනක් වේ. එය විකිණීම දවසේදී ගෙවන්ට ඕනෑය.

(*g*) දරවල සහ දූවවල වටිනාකම විකුනුම්දින ගෙවන්ට ඕනෑය.

(*h*) භාරපූ වළවල් බද්ද අවසානයේදී වසාදමන්ට ඕනෑය.

තල්පේපත්තුව.

ප්ලෑනය 9,814. ගම—හියාරේ.

| නො. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | අක්කරයක වටිනාකම, රු. |
|---|---|---|---|
| 3571 | ගල්පොත්තේකන්ද | 1 1 7 | 300 |
| 3572 | එම | 1 0 25 | 300 |
| 3573 | එම | 0 2 14 | 300 |
| 3576 | එම | 0 0 31 | 300 |
| ප්ලෑනය 2,275. ගම—හියාරේ. | | | |
| 3331 | ගල්පොත රත්මැහැර | 1 1 1 | 300 |
| 3332 | මිනිරන්වල ඉහලදෙනිය | 0 2 12 | 300 |

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වෂී 1918ක්වූ ජනවාරි මස 11වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

---

වෂී 1917ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින දැකම දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ පෙනියන නෝම්බර 3,099 දරණ ඉඩම් විකුනුම් නොතිසියේ සඳහන් නොම්බර 10,343 ප්ලෑනේ පෙනෙන නෝම්බර 4 දරණ බිම්කට්ටියද, නෝම්බර 10,402 දරණ ප්ලෑනේ පෙනියන නෝම්බර 16 දරණ බින්කට්ටි ලබන මස 5වෙනි දින විකිනීමෙන් අස්කළ බව සියළුදෙනා මෙයින් දැනගත යුතුයි.

වෂී 1918ක්වූ ජනවාරි මස 12වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
මහඒජන්ත උන්නාන්සේ වෙනුවට.

**No. 1,246, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ පෙබරවාරි මස 27වෙනි දිනවූ බදාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ වැල්ලවාය, උඩුකිඳ, යටිකිඳ, වෙල්ලස්ස සහ බුත්තල කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 22ක්.

සිතියම 1,972. ගම—වැල්ලවාය පලාතේ කන්දපල්ලකෝරලේ හාල්ඇටිතැන්නේගම.
අයිතිකමකියන්නා—ඩබ්ලිව්. ජේ. අප්පුහාමි.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කටුගොඩැල්ලේපතන .. | — | .. පතන, විහාරෙට යන පාරද, ගල්කනුද තිබේ .. | .. 0 | 1 | 8 | 40 |

අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, විලියම් පේ‍්‍රරා විසින් අල්ලාගෙන තිබේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | එම | .. විලියම් පේ‍්‍රරා .. | .. පතන, මෙම ඉඩමේ කොටසක එලවළු සහ රබර් වවාතිබේ | .. 1 | 0 | 5 | 40* |

අන්තිම සිතියම 48. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ කොටවෙර උඩගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 15*h* | එලමලගොඩ | .. මාරසිංහමුදියන්සේලාගේ අප්පු.. | පතන .. | .. 1 | 0 | 23 | 35 |
| 15*h*1 | එම | .. මාරසිංහමුදියන්සේලාගේ කිරිරාල | එම .. | .. 1 | 0 | 10 | 35 |
| 15*h*2 | එම | .. අප්පුහාමි රෙජිස්ත්‍රාර් .. | එම .. | .. 1 | 0 | 20 | 35 |

අන්තිම සිතියම 15. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ ඇල්ලේවෙලගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 17*j* | හබක්තැන්නපතන .. | — | .. කැලෑව සහ පතන, ඇලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | .. 0 | 0 | 37 | —† |
| 17*k* | එම | .. ඩබ්ලිව්. පී. අප්පුහාමි | .. පතන සහ හේන .. | .. 2 | 0 | 9 | 30 |

සිතියම 1,904. ගම—උඩුකිඳ උඩපලාතකෝරලේ අලවතුගොඩගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගල්ලිදේතැන්න | .. අගලපස්සේගෙදර චාර්ලිස්අප්පු | පතන .. | .. 3 | 0 | 30 | 35 |
| 2 | එම .. | — | .. පතන, ගම්සභාපාරට ඉතුරුකරතිබේ විකිනීමට නොවේ | .. 0 | 0 | 6 | —† |

සිතියම 1,965. ගම—වැල්ලවායපලාතේ කන්දපල්ලකෝරලේ වල්හපුතැන්නේගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | වල්හපුතැනෙහපතන .. | — | .. හේන, ඇලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | .. 0 | 1 | 12 | —† |

අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, එලියතම්බි විසින් අල්ලාගෙන තිබේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | වල්හපුතැන්නේහේන .. | — | .. තේ, කෙසෙල් තිබේ, වයස අවුරුදු 5යි | 0 | 0 | 18 | 150 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | වල්හපුතැන්නේපතන .. | — | .. පතන, පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | .. 0 | 0 | 26 | —† |
| 4 | එම | .. ඒ. ඇම්. කළුබන්ඩා | .. පතන .. | .. 1 | 3 | 5 | 60 |
| 5 | වල්හපුතැන්නේවතත .. | — | .. වත්ත, පී. ඩබ්ලිව්. ඩී. කුලී ලයිම තිබේ විකිනීමට නොවේ | .. 0 | 2 | 17 | —† |

අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, එලියතම්බි විසින් අල්ලාගෙන තිබේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6 | එම .. | — | .. අවුරුදු 5ක් වයස්වූ තේද කෙසෙල් ගස්ද තිබේ, පාරට ඉතුරුකරතිබේ, විකිනීමට නොවේ | .. 0 | 0 | 21 | —† |

සිතියම 1,974. ගම—යටිකිඳ පස්සරකෝරලේ කනහෙලගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගල්කැටියේලන්ද නොහොත් බන්ඩියගොඩ.. | — | .. පතන, පී. ඩබ්ලිව්. ඩී. එකේ ප්‍රයෝජනයට ඉතුරුකිරීමට, විකිනීමට නොවේ | 0 | 1 | 23.84 | —† |

අන්තිම සිතියම 30. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ පෙරහෙටියේගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 104 | වෙලන්ගිරියහේන | .. පෙරහැටියේ රන්ගාමි | .. හේන .. | .. 0 | 3 | 26 | 40 |
| *65bc* | එම .. | එම | .. එම .. | .. 0 | 0 | 35 | 40 |

සිතියම 1,964. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ බොරලන්දේගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | අලවත්තේදෙනිය | .. ඩබ්ලිව්. අප්පුහාමි ගමරාල | .. දෙනිය .. | .. 0 | 3 | 7 | 40 |

සිතියම 1,953. ගම—වෙල්ලස්සේ දඹගල්ලකෝරලේ මකුල්ලේගම. අයිතිකමකියන්නා—ඩී. ඇම්. ගංඇතිරාල හිටපුකෝරාල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | වැවලන්දේහේන නොහොත් හෙලවත්ත | .. මාගඇනමුල්ලේ ඒ. ඇම්. කිරිබංඩා | හේන .. | .. 1 | 3 | 27 | 20 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | එම .. | — | .. හේන, පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | .. 0 | 0 | 30 | —† |

සිතියම 1,950. ගම—බුත්තල පලාතේ බුත්තලකෝරලේ නාරන්වානගම.
අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, කිතුල්වත්තේගෙදර තිසාහාමි විසින් අල්ලාගෙන තිබේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | කිතුල්ගස්වත්ත | .. කිතුල්වත්තේගෙදර තිසාහාමි | .. ගෙයක්ද, පැලැක්ද, කෙසෙල්ගස්ද බත ලද තිබේ .. | .. 1 | 0 | 7 | 20‡ |

* විදුලි කම්බි සවිකරනලද කනුවක් මෙම ඉඩමේ තිබේ. එමනිසා මෙම ඉඩම විකුණන්නේ වර්‍ෂ 1908වේ 35වෙනි ආඥා පණතේ නියෝගවලට යටත්ව. † නොවිකුනා ඉතුරුකිරීමට. ‡ දෙවෙනි වතාවට ප්‍රසිඩකළා ඇත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරනා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 12වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොමමර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—හෝමගම අලුත් නානායමක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 16,583. ගම—හෝමගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | තිත්තවලකඩේහේනෙවත්ත .. | පොල් සහ වෙන ගස්ද ගොඩනැගිලිද තිබේ ... | .. ආර්. එන්සොහාමි සහ වෙන අය .. | *2* | *0* | *0* |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | පොල්ගස්මෙවත්ත | .. කුරුඳුපඳුරු සහ පොල්ගස් තිබේ | .. ඈම්. ලෙසිහාමි .. | .. 1 2 25·02 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 11වෙනි දින දවල් 12ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 12වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පාරවල් පල්ලකිරීම සහ වෙනඕනෑකම් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 16,590. ගම—හිරිපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මීගහවත්ත | .. පොල් සහ වෙන ගස්ද ගෙවල් 4ද තිබේ | .. මදුරුසිංපැඩිගේ පොඩියා සහ වෙන අය | .. 0 1 13·28 |
| 2 | එම | .. අතුහෙවිල්ලපු ගෙයක් සහ හිස්බිම | .. හරමානිස් .. | .. 0 0 1·99 |
| 3 | එම් | .. උළුහෙවිල්ලපු ගෙයක් .. | .. වෙත්තසිං පැඩිගේ පින්තුවා | .. 0 0 2·43 |
| 4 | බෝලෙවත්ත | .. ගෙවල් 6ද පොල් සහ වෙන ගස්ද තිබේ | .. වෙලූන් ප්‍රේරාගේ උරුමක්කාරයෝ | .. 1 1 32·56 |
| 12 | මීගහවත්ත | .. ගෙවල් 2ද පොල් සහ වෙනගස්ද තිබේ | .. හොරතල්පැඩිගේ සඳූ සහ මොහොට්ටියා | 0 2 33·84 |
| 13 | එම | .. මඩවල .. .. | .. එම .. | .. 0 0 38·37 |
| 14 | එම | .. පොල්ගස් 4ක් තිබේ .. | .. එම් .. | .. 0 0 15·01 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 11වෙනි දින උදේ 12ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 15වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[කුරුණෑගල දැන්වීම නො. 6,742.]

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඈන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත් වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රාජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඈන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනි හත්පත්තුවේ බස්නාහිර උඩුකහ කෝරලේ අතුරුවල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන 559 මුල් සිතියමේ 8Gත් පෙනෙන රූඩ්ස් 3කුත් පර්චස් 13ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් පලහටිවත්තේහේන කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට අබේසිංහ මුදියන්සෙලාගේ අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කහටගහමුලවත්තද; නැගෙණහිරට එදිරිසිංහමුදියන්සේලාගේ සියාතු බන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන බුරුගහමුලවත්තද, අබේසිංහමුදියන්සෙලාගේ සියාතුහාමි විසින් අයිතිකම්කියන ඕවිටෙවත්තද; දකුණට අබේසිංහ මුදියන්සෙලාගේ සියාතුහාමි විසින් අයිතිකම්කියන ඕවිටෙවත්තද, අබේසිංහමුදියන්සෙලාගේ ඩින්යිරිබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන පලහටිවත්තද; බස්නාහිරට අබේසිංහමුදියන්සේලාගේ අප්පුහාමි සහ තවත්අය විසින් අයිතිකම්කියන කහටගහමුලවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 35වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 1—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 6,743.]

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී අන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රාජසන්තක ඉඩම හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ඈන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

## ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ දකුණු යටිකහකෝරළේ ඇන්නාරුව යන ගම් පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

### I.—මුල් සිතියම 963.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 76K | කැටිම්පියාවකුඹුරපිල්ලෑව | 0 3 0 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණපු කන්කානියවෙලපිල්ලෑව (289,335 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); නැගෙණහිරට සාමෙල් නයිදේ විසින් අයිතිකම්කියන කැටිම්පියාවකුඹුර; දකුණට ආණ්ඩුව විසින් විකුණපු අස්වැද්දුමනුග ගහමූලහේන (291,351 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු කන්කානියවෙලේපිල්ලෑව (289,335 පිඹුරුකඩදාසියේ පේන ඉඩම).

### II.—මුල් සිතියම 963.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 81AI | වැලිපිල්ලෑව | 1 0 25 |
| 85B | වැලිහේන | 0 3 24 |
| | | 2 0 9 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණපු පුහුවැවවත්ත (296,800 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), වැව්කන්ඩියක්ද, ආණ්ඩුව විසින් විකුණපු ඇටඹගහඅගාරේහේන (325,556 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු ඇටඹගහඅගාරේහේන (325,556 පිඹුරුකඩදාසියේ පේන ඉඩම; දකුණට ආණ්ඩුව විසින් විකුණපු අඹුවත්තෙවත්ත 325,442 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), ප්‍රවේනිඅව්ටික්කාගහවතුයාය; බස්නාහිරට ප්‍රවේනිඅව්ටික්කාගහවතුයාය.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 36වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 2—1918.]

---

[කුරුනෑගල දූන්වීම නො. 6,744.]

වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900යේ සහ 1903තේ ආඥපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත්පත්තුවේ දකුණු යටිකහකෝරළේ දික්වෙල යන ගමේ පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 968 මුල් සිතියමේ 7Qන් පෙනෙන අක්කර 1 රූඩ් 1 සහ පර්චස් 12ක් බිම්තරම ඇති සමාන්‍යවශයෙන් දික්වෙල්වත්තේහේන කියන නොහොත් ඒ නමින් දැනගෙණ තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට බස්නායකමුදියන්සෙලාගේ කිරිබන්ඩා විදුනේ විසින් අයිතිකම්කියන වැකන්දේවත්ත; නැගෙණහිරට නාරන්ගල්ල යන ගමේ ගම්ඉම; දකුණට ආණ්ඩුව විසින් විකුණපු ගල්ගේගාවවත්ත (305,621-පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); බස්නාහිරට බස්නායකමුදියන්සෙලාගේ හින්ඛිරිබන්ඩා විසින් අයිතිකම්කියන අඹුකොටුවේවත්ත, බස්නායකමුදියන්සෙලාගේ කිරිබන්ඩා විදුනෙ විසින් අයිතිකම්කියන වැකන්දෙවත්ත.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 37වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 3—1918.]

---

[කුරුණෑගල දූන්වීම නො. 6,745.]

වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899 1900 සහ 1903තේ ආඥයණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මනිඝ්‍රශවරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට කිසි අයිතිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මනිඝ්‍රශවරයානන්නාන්සේට ඉහතකී ආඥපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශේෂ මනිඝ්‍රශවරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනි හත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරළේ පොතුපිටිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 553 මුල් සිතියමේ 13න් පෙනෙන අක්කර 1කුත් පර්චස් 22ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් පොතුපුරහ කියන නොහොත් ඒ නමින් දැනගෙණ තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට එව්ස්අප්පුහාමි සහ තවත්අය විසින් අයිතිකම්කියන පරගහපිටියකුඹුරද; නැගෙනහිරට පුන්චිමැනිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන පහලපිටකොටුවේකුඹුරද; දකුණට උක්කුබන්ඩා විසින් අයිතිකම්කියන පිටකොටුවේකුඹුරද; බස්නාහිරට අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන පිටකොටුවේකුඹුරද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 37වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 4--1918.]

[කුරුණෑගල දැන්වීම නො. 6,746.]

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ හිරියාලහත්පත්තුවේ ඉහලවිසිදෙකෙකෝරලේ උඩත්තාවපොල යන ගම පිහිටා තිබෙන මීට අමුණාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මුල් සිතියම 4,291.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| R 70A | අඩිපාර | 0 0 21 |
| R 70B | එම | 0 0 13 |
| T 70A | එම | 0 0 6 |
| | | 0 1 0 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන වෙවැල්හේනද (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය); නැගෙණහිරට ඩී. ජී. ජයවර්ධන උන්නැහේ විසින් අයිතිකම්කියන වෙවැල්හේනද, බස්තියන් ද සිල්වා විසින් අයිතිකම්කියන වෙවැල්හේනද; දකුණට බස්තියන් ද සිල්වා විසින් අයිතිකම්කියන වෙවැල්හේනද, ඩී. ජී. ජයවර්ධන විසින් අයිතිකම් කියන වෙවැල්හේනද, ඇලත්ද; බස්නාහිරට ජේ. සී. ද සිල්වා නෝනා විසින් අයිතිකම්කියන වැල්ලිකන්දේහේනද, ඩී. ජී. ජයවර්ධන විසින් අයිතිකම්කියන වෙවැල්හේනද, බස්තියන් ද සිල්වා උන්නැහේ විසින් අයිතිකම්කියන වෙවැල්හේනද, ඩී. ජී. ජයවර්ධන විසින් අයිතිකම්කියන වෙවැල්හේනද, බන්ඩියා විසින් අයිතිකම්කියන පිහිලඇලහේනද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 38වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනැගල වි. ම. 5—1918.]

---

[කුරුනෑගල දැන්වීම නො. 6,747.]

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900, සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ හිරියාලහත්පත්තුවේ ඉහලවිසිදෙකෙකෝරලේ පන්නල යන ගම පිහිටාතිබෙන මීට අමුණාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.—මුල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| Y 823A | පාර | 0 0 19 |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු පාරද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුනාපු කොස්ලන්ද නොහොත් වාගොල්ලේහේනද (263,970 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); දකුණට යකලා ඇලද (බක්මීගොල්ල යන ගමේ ගම්ඉම) බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු කොස්ලන්ද නොහොත් වාගොල්ලේහේනද (263,970 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), මුදන්නගොඩකන්කානමලාගේ බස්තියන් ප්‍රනාන්දු විසින් අයිතිකම්කියන ඇතාවැටුනුමැදපිල්ලෑවද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු පාරද.

II.—මුල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| Y 823B | ඇල | 0 0 26 |

මීට මායිම්—උතුරට කොස්ලන්ද නොහොත් වාගොල්ලේහේනද, (263,970 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) ආණ්ඩුව විසින් විකුනාපු අඹගහපිටියද; නැගෙණහිරට දඹුල්ලෙ හිට කුරුනෑගලට යන පාරද; දකුණට කොස්ලන්ද නොහොත් වාගොල්ලේහේන (263,970 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); බස්නාහිරට යකලාඇලද, බක්මීගොල්ල යන ගමේ ගම්ඉම.

III.—මුල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| C 824A | පාර | 0 0 10 |

මීට මායිම්—උතුරට බාලසූරියමුදියන්සේලාගේ කපුරුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන මීගහකුඹුර නොහොත් රන්ගාගේකුඹුරද; නැගෙණහිරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු පාරද; දකුණට බාලසූරියමුදියන්සේලාගේ කපුරුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන මීගහකුඹුර නොහොත් රන්ගාගේකුඹුරද; බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු පාරද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 38—43වෙනි පිටුවල ප්ලෑන් බලනු.

## IV.—මූල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| E 825A | ඇළ | 0 0 2 | Y 828A | ඇළ | 0 0 4 |
| K 825A | එම | 0 0 7½ | Z 828A | එම | 0 0 13 |
| F 826C1 | වෙලඇළ (ඇළ) | 0 0 6 | B 829A | එම | 0 0 5 |
| F 826G | එම | 0 0 10 | C 829A | එම | 0 0 1 |
| F 826H1 | ඇළ | 0 0 2 | | | |
| F 826I | (වෙලඇළ) (ඇළ) | 0 0 34 | | | 0 2 4½ |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන වෙලඇළද, ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුනපිට හේනද (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); නැගෙනහිරට ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුන්පිටිය හේනද (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ප්‍රවෙනි ප්‍රවේසමට ඉතුරුකර තිබෙන ඉඩමද, බී. ඇන්. කිරිහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කපහේඇළද, ආණ්ඩුව විසින් විකුණාපූ පතිරගේවත්තේපිල්ලෑවද (263,067 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුණාපූ අඹගහමූලහේනද (281,607 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ අඹගහමූලහේනද, (266,262 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ කදුරුගහමූලපිල්ලෑවද (266,278 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ප්‍රවෙනිකුරුපිටියහේන්යායද; ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුන පිටහේනද, (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියකුඹුරද, (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුනපිටහේනද (313;320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), බාලසූරියමුදියන්සෙලාගේ මුදලිහාමි විසින් අයිතිකම්කියන බෝගහමූලවත්තද, නිදහස් ඔප්පුවක් පිට දීපූ කෝන්ගහදළුපොතද; දකුණට නිදහස් ඔප්පුවක්පිට දිපූ කෝන්ගහදළුපොතද; බස්නාහිරට නිදහස් ඔප්පුවක්පිට දීපූ කෝන්ගහදළුපොතද; බාලසූරියමුදියන්සෙලාගේ මුදලිහාමි විසින් අයිතිකම්කියන බෝගහමූලවත්තද; ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුනපිටහේනද (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියකුඹුරද (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුනපිටියහේනද (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ගල්කැටිගම යන ගමේ ගම්ඉමද, ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේනද, (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුනපිටියහේනද) 313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ප්‍රවෙනිකුරුපිටිය හේන්යායද, ආණ්ඩුව, විසින් විකුනාපූ අඹගහමූලහේනද (266,282 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපූ අඹගහමූලහේනද, (281,607 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම, ආණ්ඩුව විසින් විකුනාපූ පතිරගේවත්තේපිල්ලෑවද, (263,067 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ප්‍රවෙනිකුරුපිටියහේන්යායද, ආණ්ඩුව විසින් විකුනාපූ කුරුපිටියහේන සහ මුදුන් පිටහේනද (313,320 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම).

## V.—මූල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| U 826A | ඇළ | 0 0 3 | K 827A | ඇළ | 0 0 0½ |
| B 827B1 | එම | 0 0 1 | L 827A | එම | 0 0 6 |
| B 827C | එම | 0 0 8 | | | |
| I 827A | එම | 0 0 6 | | | 0 0 24½ |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපූඇළද. මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපූ ගොඩඉස්සරකුඹුරද, පන්නල යන ගමේ ගම්ඉමද, (නැගෙනහිර කොට්ටාසේ); නැගෙනහිරට පන්නල යන ගමේ ගම්ඉමද (නැගෙනහිර කොට්ඨාසයේ). බාලසූරියමුදියන්සේලාගේ පුන්චිරාල විසින් අයිතිකම්කියන පුස්වෙලිගේවෙලද, බන්නකුආරච්චි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන අඹගහමූලකොටුවද, පන්නල යන ගමේ ගම්ඉමද, (නැගෙනහිර කොට්ටාසේ), බන්නකුආරච්චි සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹගහමූලකොටුවද, බී. ඇම්. බන කෝරල හිටපූ ආරච්චි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කපුගේහේන නොහොත් ගොඩබිත්තර පෙලද, ආණ්ඩුව විසින් විකුනාපූ රද්දකොටුවද (312,738 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුනාපූ රදකොටුවේපිටියද; බස්නාහිරට ප්‍රවේනිගන්ගොඩවත්තද, ආණ්ඩුව විසින් විකුනාපූ රද්දකොටුවද, 312,738 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), බී. ඇම්. බනකෝරල හිටපූ ආරච්චි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කපුගේහේන නොහොත් ගොඩබිත්තරපැලද, බන්නකු ආරච්චි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන අඹගහමූලකොටුවද, බාලසූරියමුදියන්සේලාගේ පුන්චිරාල විසින් අයිතිකම්කියන පුස්වෙලිගේවෙලද.

## VI.—මූල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| C 827A | ඇළ | 0 0 0½ | J 828A | ඇළ | 0 0 2 |
| D 827A | එම | 0 0 4 | | | |
| G 828A | එම | 0 0 2 | | | |
| I 828A | එම | 0 0 6 | | | 0 0 14½ |

මීට මායිම්—උතුරට බී. ඇම්. රන්මැනිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන ගලකුඹුරද; නැගෙණහිරට මුදියන්සෙ විදානේ ආරච්චි විසින් අයිතිකම්කියන නිතුල්ලගහමූලකුඹුරද, බාලසූරියමුදියන්සේලාගේ උක්කුමැනිකා විසින් අයිතිකම්කියන ගම්මෙරිගහකුඹුරද, කිරිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කප්පනවත්තද, බාලසූරියමුදියන්සේලාගේ කිරිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කප්පනකුඹුරද, කිරිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කප්පනවත්තද, ආණ්ඩුව විසින් විකුණාපූ මිගහමූලපිල්ලෑවද; දකුණට මුදියන්සෙ ආරච්චි විසින් අයිතිකම්කියන ලින්දකුඹුරද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණාපූ මිගහමූලපිල්ලෑවද, කිරිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කප්පනවත්තද, ආණ්ඩුව විසින් විකුණාපූ ගම්මෙරිගහකුඹුරේපිල්ලෑවද, බී. ඇම්. මුදියන්සෙ හිටපූආරච්චි සහ තවත් අය විසින් අයිතිකම්කියන මූගුනගහමූලහේනද, ආණ්ඩුව විසින් විකුණාපූ ගලගාවාකුඹුරද, (310,797 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම )

## VII.—මූල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| O 827A | ඇළ | 0 0 2 | S 827A | ඇළ | 0 0 3½ |
| P 827A | එම | 0 0 1½ | | | |
| R 827A | එම | 0 0 2 | | | 0 0 9 |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපූ උනගහවැවගාලද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපූ ඇටඹගහමූලගාලද; නැගෙණහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපූ ඇළද, බී. ඇම්. කළුමැනිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන හැලඹගහකුඹුරද, මුදියන්සෙ ආරච්චි විසින් අයිතිකම්කියන උනගහමූලකුඹුරද, පතිරන්නැහෙලාගේ චිකිරිමැනිකේ විසින් අයිතිකම්කියන ලින්ද කුඹුරද, බාලසූරියමුදියන්සේලාගේ පුන්චිරාල විසින් අයිතිකම්කියන ලින්දේකුඹුරද; දකුණට බාලසූරියමුදියන්සේලාගේ රන්

මැනිකා විසින් අයිතිකම්කියන ගලගාවාකුඹුරද, බී. ඇම්. රත්මැනිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන ගලකුඹුරද; බස්නාහිරට බී. ඇම්. මැනික්රාල සහ තවත් අය විසින් අයිතිකම්කියන මීගහමූලවත්ත නොහොත් පහලගෙදරවත්තද, මුදියන්සේ ආරච්චි විසින් අයිතිකම්කියන ගලගාවාවත්තද.

VIII.—මුල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|
| T 827A .. | ඇල .. .. | 0 | 0 | 6 | D 828B .. | ඇල .. .. | 0 | 0 | 8 |
| Y 827A .. | එම .. .. | 0 | 0 | 3 | H 828A .. | එම .. .. | 0 | 0 | 2 |
| A 828A .. | එම .. .. | 0 | 0 | 8½ | N 828A .. | එම .. .. | 0 | 0 | 7½ |
| B 828A .. | එම .. .. | 0 | 0 | 1 | | | | | |
| D 828A .. | එම .. .. | 0 | 0 | 0¼ | | | 0 | 0 | 36¼ |

මිට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රාජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ඇලද, මුදියන්සේ ආරච්චි සහ තවත් අය විසින් අයිතිකම්කියන මරක්කයාවත්තද, පූන්චිඑතනා සහ තවත් අය විසින් අයිතිකම්කියන කොස්ගහමූලවත්තද, ආණ්ඩුව විසින් විකුණපු මීගහමූලගාලද, පූන්චිඑතනා සහ තවත් අය විසින් අයිතිකම්කියන කොස්ගහමූලවත්තද, බී. කිරිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන බෝගහමූලවත්තද, බී. ඇම්. මැනික්රාල සහ තවත් අය විසින් අයිතිකම්කියන මීගහමූලවත්ත නොහොත් පහලගෙදරවත්තද. බී. ඇම්. මුදියන්සේ ආරච්චි විසින් අයිතිකම්කියන ගලගාවාවත්තද, මුදියන්සේ ආරච්චි විසින් අයිතිකම්කියන ගලගාවවත්තද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රාජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ඇලද; නැගෙණහිරට මුදියන්සේ ආරච්චි විසින් අයිතිකම්කියන ගලගාවාවත්තද, බී. ඇම්. මුදියන්සේ ආරච්චි විසින් අයිතිකම්කියන ගලගාවාවත්තද, බී. ඇම්. මැනික්රාල සහ තවත් අය විසින් අයිතිකම්කියන මීගහමූලවත්ත නොහොත් පහලගෙදරවත්තද, පූන්චිඑතනා සහ තවත් අය විසින් අයිතිකම්කියන කොස්ගහමූලවත්තද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු මීගහමූලගාලද, (263,020 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම) පතිරන්නැහලාගේ විකිරිමැනිකා විසින් අයිතිකම්කියන මීගහමූලවත්තද; බස්නාහිරට මුදියන්සේආරච්චි සහ තවත් අය විසින් අයිතිකම්කියන මරක්කයාවත්තද.

IX.—මුල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| X 828A .. | ඇල .. .. .. .. | 0 | 0 | 19½ |

මිට මායිම් – උතුරට ආණ්ඩුව විසින් විකුණපු පතිරන්ගේවත්තද වෙලද, (263,066 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම); නැගෙණහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රාජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ඇලද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු පතිත්ගේවත්තේවෙලද, (263,066යේ පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම); බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රාජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ඇලද.

X.—මුල් සිතියම 1,880.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|
| V 830A .. | වෙලඇල ( ඇල ) | 0 | 0 | 4 | Z 830 .. | වෙලඇල ( ඇල ) | 0 | 0 | 6½ |
| V 830B1 .. | එම | 0 | 0 | 0½ | C 831A .. | එම | 0 | 0 | 10½ |
| X 830A .. | එම | 0 | 0 | 5 | | | | | |
| Y 830A .. | එම | 0 | 0 | 7 | | | 0 | 0 | 33½ |

මිට මායිම්—උතුරට වැවකුඹුරේපිල්ලෑව (263,118 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), දිවුල්ගහමූලවතත (266,281 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), 298,002 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩමද, අඩප්පේමූලවත්ත (283,129 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), අඩප්පේමූලවෙල (283,129 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), ප්‍රවෙනි අඩප්පේමූලහේනද, මුදලිහාමි විදානේ විසින් අයිතිකම්කියන අඩපාමූලකැටකොප්පුවහේන්යායද; නැගෙණහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රාජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ඇලද; දකුණට මුදලිහාමි විදානේ විසින් අයිතිකම්කියන අඩපාමූලකැටකොප්පුවහේන්යායද, ප්‍රවෙනි අඩපාමූලහේනද, අඩපාමූලවෙලද (283,129 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), අඩපාමූලවත්ත (283,129 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), දිවුල්ගහමූලවත්ත (266,281 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම), වැවකුඹුරේපිල්ලෑව (263,118 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම); බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන වෙලඇලද.

[කුරුනෑගල වි. ම. 6—1918.]

---

[අනුරාධපුර දැන්වීම නො. 6,748.]

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එකී කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රාජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ නුවරගම් පලාතේ විලච්චියකෝරලේ මොරගොල්ල කඩවත්තුලානේ හොච්චියාගම යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන 699 මුල් සිතියමේ 37න් පෙණෙන අක්කර 61කුත් රූඩ් 3කුත් පර්චස් 18·5ක් බිම්තරම ඇති සමාන්‍ය වසයෙන් ලන්දුකැලේ කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්:—උතුරට පූත්තලමේ සිට අනුරාධපුරේට යන මහපාරද; නැගෙණහිරට 121,986 පිඹුරුකඩදසියේ පේන ඉඩමද, රාජසන්තක අක්කරඉඩමද, 240 275 පිඹුරුකඩදසියේ පේන ඉඩමද, හල්මිල්ලකුලමට යන කරත්ත පාරද, හල්මිල්ලකුලමට යන කරත්ත පාරද, රාජසන්තක හල්මිල්ලකුලමද (මිනිපිට්ටනිය); දකුණට හල්මිල්ලකුලම යන ගමේ ගම්ඉමද; බස්නාහිරට දුනුදඹුවැව යන ගමේ ගම්ඉමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්විමෙන් අත්හැරියවගත් ඒවායේ මුළු බිම්තරම වන අක්කර 2කුත් රූඩ්ස් 3කුත් පර්චස් 2·5හ ඉහතකී අක්කර 61කුත් රූඩ්ස් 3කුත් පර්චස් 18·5යේ බිම්තරමේ අඩංගු නොවෙන වගත් මෙයින් දැනගත යුතුයි.

මුල් සිතියම 699.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|
| A 35 | වත්ත (කැලූ ඒජන්තගේ බන්ගලාව).. | 0 | 3 | 27 | B 39 | මුඩුබිම .. | 0 | 0 | 4 |
| A 58 | කරත්තපාර .. | 0 | 0 | 1 | B 40 | ඇල (දියපාර) .. | 0 | 0 | 17 |
| B 37B | අක්කරඉඩම .. | 0 | 0 | 1·5 | B 44 | වත්ත (240,274 පිඹුරුකඩදසියේ පේන ඉඩම) .. | 0 | 0 | 18 |
| B 37D | එම .. | 0 | 0 | 2 | B 59 | වත්ත .. | 0 | 0 | 15 |
| B 37E | එම .. | 0 | 0 | 1 | | | | | |
| B 38 | වත්ත (223,842, 197,931. 250,657 යන පිඹුරුකඩදසිවල පේන ඉඩම) .. | 1 | 1 | 36 | | | 2 | 3 | 2·5 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 44වෙනි පිටේ ප්ලෑනය බලනු.

[අනුරාධපුර වි. ම. 1—1918.]

[ඌව දැන්වීම නො. 6,749.]

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 18වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙනයම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන් වහන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැරදක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,

ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඌව දිසාවේ උඩුකින්ද කොට්ඨාසයේ දෙහිවිනි පලාතකෝරලේ ඇතම්පිටිය යන ගම පිහිටාතිබෙන මීට අමුනාපූ සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මුල් සිතියම 197.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 20 .. | කුඹල්අරාවේහේන .. .. .. .. | 0 3 32 |
| 20A .. | එම .. .. .. .. | 0 2 5 |
| | | 1 1 37 |

මීට උතුරට රජසන්තක කොටුගොඩැල්ල පතනද; නැගෙනහිරට රජසන්තක කොටුගොඩැල්ල පතනද, ආණ්ඩුව විසින් විකුණාපු උඩඅරාවේපතනද, (302,627 පිඹුරුකබඩාසියේ පෙනෙන ඉඩම) ආණ්ඩුව විසින් විකුණාපු මැදගොඩද, (302,917 පිඹුරු කබඩාසියේ පේන ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුණාපු මැදගොඩද, (302,877 පිඹුරුකබඩාසියේ පේන ඉඩම); බස්නාහිරට ජතිතුරේ කිරිබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන ජතිතුරේ කුඹුරද, කන්සාවත්තේ කිරිවන්තේ විසින් අයිතිකම්කියන කුඹල් ආරාවද, රජසන්තක කොටුගොඩැල්ලේපතනද.

II.—මුල් සිතියම 197.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 73D .. | පරණපාර .. .. .. .. .. | 0 0 29 |

මීට මායිම්—උතුරට පහමුරුතොට පුංචිරාල විසින් අයිතිකම්කියන තවලන්තැන්නේවත්තද, 57,613 පිඹුරුකබඩාසියේ පේන ඉඩමද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ මොරගොල්ලේගෙදර අප්පුහාමි ගමරාල සහ තවත් කෙනෙකුට විකුණාපු තවලන්තැන්නේවත්තද; නැගෙණහිරට දියපාරක්ද; දකුණට 57,614 පිඹුරුකබඩාසියේ පේන ඉඩමද, කරත්තපාරක්ද; බස්නාහිරට පහමුරුතොට පුංචිරාල සහ තවත් අය විසින් අයිතිකම්කියන තවලන්තැන්නේවත්තද.

III.—මුල් සිතියම 197.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 83A .. | මාපාගලකන්ද සහ කිරිබත්ඇලේපතන .. .. .. | 28 0 24 |

මීට මායිම්—උතුරට ඇල්ලේආරාවේකන්දුරද; නැගෙණහිරට නුවරඑළියට යන කරත්ත පාරද; දකුණට ගිරඹේ කන්දුරද (වැල්ලේවෙල යන ගමේ ගම්ඉමද), වැල්ලේවෙල යන ගමේ ගම්ඉමද, ගිරඹේකන්දුරද; බස්නාහිරට ඇල්ලේ ආරාවේකන්දුරද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්වීමෙන් මේ කොටසෙන් අත්හැරිය වගත් ඒකේ බිම්තරම වන අක්කර 2කුත් පර්චස් 28ට ඉහතකී අක්කර 28කුත් පර්චස් 24රේ බිම්තරමේ අඩංගු නොවෙනවගත් මෙයින් දැනගත යුතුයි.

මුල් සිතියම 197.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 83A1 .. | ගිරඹේකුඹුර .. .. .. .. | 2 0 28 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 44—45වෙනි පිටුවල ප්ලෑන් බලනු.

[ඌව වි. ම. 1—1918.]

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

පූත්තලමේ උතුරු ලුණු දෙපාර්තමේන්තුවේ මූලාදෑනි වාසය කරණ ගෙවල් අළුත් වැඩියා කෙරීමට ඉල්ලුම්පත්‍ර බාර ගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප් එක උඩ වම්පැත්තේ මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්;— "පූත්තලමේ උතුරු ලුණු දෙපාර්තමේන්තුවේ මූලාදෑනි වාසය කරණ ගෙවල් අළුත්වැඩියා කෙරීමට ඉල්ලුම්පත්‍රයයි." තවද එම ඉල්ලුම්පත්‍රය වර්ෂ 1918ක්වූ ජනවාරි මස 28වෙනි දින පස්වරු එකට මත්තෙන් පූත්තලමේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලන්ට අදහස්කරණ තැනැත්තා ඉල්ලුම්පත්‍රය එවන්ට මත්තෙන් රුපියල් 10ක් යම් කච්චේරියක "ටැන්ඩර් පෝර්ම්ස්" යන ගණන යටතේ බැඳ රිසිට් එකක් ලබා එම රිසිට් එක ඔහුගේ ඉල්ලුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. මෙසේ බඳිනලද රුපියල් 10ය උප ඒජන්ත උන්නාන්සේ විසින් ඇපයක් වශයෙන් තබාගනු ලැබේ. එනම්, යම් ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ලීම බාරගත් කල්හි එකී ඉල්ලුම්කාරයා බාරගත් වැඩේ සතුටුදායක අන්දමක ටකරදෙනවාය කියා උප ඒජන්ත උන්නාන්සේ සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිසය. එසේ සෑහෙන කාලයක් ඇතුළත එකී කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට නොයෙදුනොත් මතුකී රුපියල් 10ය රජසන්තක කරණු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පූත්තලමේදී ලිවුම් දෙන පිණිස නොහොත් ලැබෙන පිණිස ඇඩ්‍රෑස් එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්තුවට බැඳී සුමාන 4ක් ඇතුළතදී වැඩේ කර ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණා පූත්තලමේ ලුණු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනගෙන් දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

සමාන්‍ය අලුත්වැඩිය කෙරීම යනාදිය.

දැනට ගොඩනැගිලිවල තිබෙන සියළුම දිරායිය නොහොත් වෙන යම් විදියකට පාවිච්චිකළ නොහැකි පොල්අතු, ලීදඬු යනාදිය අහක්කොට ඒවා වෙනුවට අළුත් සම්ඇති ඒවා දමන්ට ඕනෑය.

පොල්අතු සෙවිලිකර තිබෙන සියලුම ගෙවල් සහ පිට ගෙවලුත් අලුත් පොල්අතුවලින් සෙවිලිකර බර වෙනුවට මාංගු දමන්ට ඕනෑය.

සියලුම ගෙවල්වල සහ පිට ගෙවල්වලත් ගේ බිම් මැටිදමා උස්කර, සමතලාකර, තදකර ගොමගාන්ට ඕනෑය.

බිත්ති මැටිවුනත් පොලිඅතුවුනත් ඕනෑකරන තැන් අලුත් වැඩියාකරන්ට ඕනෑය. ගොඩනැගිලි වටේට තිබෙන සියලුම වැටවල් නැවතත් සාදන්ට නොහොත් අලුත්වැඩියාකරන්ට ඕනෑය. ඕනෑකරනතැන්වලට අලුතෙන් කෝටු හිටවන්ටත් ඕනෑය.

විශේෂ අලුත්වැඩියා කෙරීමවල්.

ලුණු සාරප්පැනගේ බංලාව.—කුස්සියේ ඉස්සරහ තාප්පෙ මැටිවලින් කපලාරුකරන්ට ඕනෑය.

කක්කුස්සිය අලුත්වැඩියා කරන්ට ඕනෑය.

අඩි 17ක් දිගින්ද, අඩි 7ක් පළින්ද ඇති වසනලද පාරක් මුල්ගෙට සහ කුස්සියටත් අතර සාදා පොල්අතුවලින් සෙවිලි කරන්ට ඕනෑය.

මුල්ගෙදර තුන්පැත්තක බිව්ච්වල කඩාබිඳීගොස් තිබෙන තැන් කපලාරුකර සුදුහුනු ගාන්ට ඕනෑය.

පළමුවෙනි කලෑසියේ කොස්තාපල්ගේ ගෙදර.

ඕනෑකරන තැන්වල ගෙයි බිමට ගඩොල්අල්ලා බදාම අල්ලන්ට ඕනෑය.

කුස්සියේ ඉස්සරහ බිත්ති මැටිවලින් කපලාරුකරන්ට ඕනෑය. ඒ බිත්තිවල පිටපැත්තට පොල්අතු අල්ලන්ට ඕනෑය.

ඉස්තෝප්පුවට කනුවක් සහ බාල්කෙකුත් දමන්ට ඕනෑය.

දෙවෙනි ටඃසියේ කොස්තාපල්ගේ ගෙදර.

ඉස්තෝප්පුවේ තිබෙන්නාවූ බාල්ක දෙකක් අහක්කර ඒවා වෙනුවට අළුත්ඒවා දමන්ට ඕනෑය.

මුරකාර රතදීන්ගේ ගෙදර.

දොරේ සහ ජනේලත් උලුවහු සහ පියනුත් රතුතීන්තෙන් පින්තාරුකර ජනේලෙට කොක්කක් දමන්ට ඕනෑය.

මේ ගෙදර තිබෙන පරණ බාල්කයක් අහක්කොට ඒ වෙනුවට අලුත් එකක් දමන්ට ඕනෑය.

මුරකාර බින්ගේ ගෙදරට මුදුන්කනුවක්ද, හරස් බාල්කයක්ද, පැති කනුවක් සහ පැති බාල්කෙකුත් අලුතෙන් දමන්ට ඕනෑය.

මුරකාර තිබ්බල්ගේ ගෙදරට පැති කනුවක් අලුතෙන් දමන්ට ඕනෑය.

මුරකාර තාජේර්ගේ ගෙදර ඉස්තෝප්පුවට අලුතෙන් පැති බාල්කයක් දමන්ට ඕනෑය. තවද දොරේ සහ ජනේලත් උලුවහු සහ පියනුත් රතු තීන්තෙන් පින්තාරුකරන්ට ඕනෑය.

මුරකාර මිංගල්ගේ ගෙදර.

මුදුන්කනුවක්ද, පැතිකනු 2ක්ද, පැතිබාල්ක 2ක්ද නැවත දමන්ට ඕනෑය. දොරද ජනේල සහ ඒවායේ පියන්ද රතු පාටෙන් පින්තාරුකර අලුත්වැඩියාකරන්ට ඕනෑය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 9වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

කොහොලන්කල ලේවායේ ගොඩදමා තිබෙන ලුණු හොණ්ඩර 14,000 මසකට සාමාන්‍යවශයෙන් හොණ්ඩර 10,000 බැගින් හම්බන්තොට ගුදම්වලට ගෙණඒම පිණිස ඉල්ලුම්පත්‍ර මෙයින් උවමනාකරනු ලැබේ.

2. සියලුම ඉල්ලුම්පත්‍ර පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. තවද එය එක කවරයක් තුළ බහා සීල්කර හම්බන්තොට උපඒජන්ත උන්නාන්සේගේ නමට එවිය යුතුය.

3. මුල් ඉල්ලුම්පත්‍රය උපඒජන්ත උන්නාන්සේට යවනවා සමගම ඉන් කොපියක් ඉල්ලුම්කාරයා විසින් ශරුකටයුතු අඳ යම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානතැන වෙත යවන්ට ඕනෑය.

4. සියලුම ඉල්ලුම්පත්‍රවල කවරයේ වම්පැත්තේ උඩින් "ලුණු ඇදීමට ඉල්ලුම්පත්‍රය" කියා ලකුණුකළ යුතුවා පමණක් නොව වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 1වෙනි දින දවල් 12ට ප්‍රථම ඒවා උපඒජන්ත උන්නාන්සේගේ කන්තෝරුවට ලැබෙන්ට ඕනෑය.

5. සියලුම ඉල්ලුම්පත්‍ර හම්බන්තොට කච්චේරියෙන් ලබාගන්නාලද ෆෝම්කොලවල විය යුතුය. එම ෆෝම්කොලවල නොවන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් ෆෝම්කොල ලබාගන්ට ප්‍රථම කොළඹ ට්‍රෙෂරියේ හෝ වෙන කොයිම කච්චේරියක තුමුන් රුපියල් 20ක් බැඳ ලබාගන්නාලද කුවිතාන්සියක් පෙන්වන්ට ඕනෑය. ඉල්ලුම්පත්‍රය භාරගත් බැව් දැනුම්දී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනගෙන් හෝ ඒ වෙනුවෙන් පත්කරණලද වෙනයම් මූලාදෑනියෙකුගෙන් අඥාවක් ලැබී දවස් 10ක් තුළ කොන්ත්‍රාත්වට බැඳී ඔප්පුව අත්සන් නොකර පැහැරහැරියොත් එහෙනොත් නියමකරනලද ඇපය දෙන්ට නුපුළුවන් උනොත් ඉහතකී මුදල රජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව අත්සන්කළාටපසු අනිකුත් සියලුම මුදල් ආපසු ගෙවනවා ඇත.

7. එක එක ඉල්ලුම්පත්‍රය වගකියහැකි අය දෙදෙනෙක් විසින් අත්සන්කරණලද ලියමණක් සමග එවිය යුතුය. ඒ දෙදෙනාගේ නම ගම සහ තැපැල්පල ඒ ලියමනේ සඳහන් කරන්ට ඕනෑවා පමණක්නොව කොන්ත්‍රාත්තුව නිසියාකාර කරනලෙස ඔවුන් ඇපයට බැඳෙන්ඕද ඕනෑය.

8. එක එක කොන්ත්‍රාත්තුව නිසියාකාර කරණලෙස ඔප්පුවකට බැඳීමට සෑහෙනතරම් ඇපකාරයෝ උවමනාය. උවමනාකරණ ඇප මුදල රුපියල් 500ක් වේ. වෙනත් සියලුම තොරතුරු 5වෙනි වගන්තියේ සඳහන් කන්තෝරුවෙන් දැනගන්ට පුළුවන.

9. එක එක ඉල්ලුම්පත්‍රයේ මේ කාරනා සඳහන්කළයුතුය, එනම්:—

(1) ලුණු ගැනීමට පැමිණෙන කරත්ත ඇතුළුව බොන් එකකට මුදල.

(2) තමන් විසින්ම ගෙණඒමට භාරගන්නා ප්‍රමාණය.

(3) ලුණු ගැනීමට පැමිණෙන කරත්ත නැතුව ටොන් එකකට මුදල.

10. ලුණුමළු කිරීමද, පැටවීම ''හ බෑමද ආණ්ඩුවේ වියදමෙන් කරනු ලැබේ.

11. ඉහතකී සියළුම කාරනාවලට එකඟනොවන කොයිම ඉල්ලුම්පත්‍රයක්වත් භාරගනු නොලැබේ.

12. එකක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමටද, යම් ඉල්ලුම්පත්‍රයකින් කොටසක් භාරගැනීමටද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

ඩබ්ලිව්. ඇල්. මර්පි,
ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 10වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912ගේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

රා විකුණන තැබෑරුම් වැසීම සඳහා දැන්වීම.

මෙහි පහත දක්වන ෂැඩුල් පත්‍රයේ සඳහන්වන රා විකුණන තබෑරුම් වර්ෂ 1918ක්වූ ඔක්තෝම්බර් මස පළමුවෙනි දින පටන් වහන්ට අදහස්කර තිබෙන බව මෙයින් දන්වන්නේය.

2. වර්ෂ 1918ක්වූ මාර්තු මස දෙවෙනි දින වනතුරු එකී ස්ථාන සම්බන්ධව කාරණ ගෙනහැර පාන ලියවිලි භාරගන්ට මම ලෑස්තිව සිටිමි. එකී දවසේ දවල් 10ත් දවල් 2ටත් අතරතුර එකී ස්ථාන සම්බන්ධව මා සමග කටින් කියන කාරණ අහන්ට මම ලෑස්තිව සිටිමි.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 11වෙනි
දින මාතලේ කච්චේරියේදීය.

ජී. ඊ. මිලිංටන්,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

ෂැඩුල් පත්‍රය.

මාතලේ දකුණු පලාත.

1. බෝවත්ත වසමේ මායිම්තුළ තිබෙන නොම්මර 9 රා තැබෑරුම.
2. ඉඹුල්පිටිය වසමේ මායිම්තුළ තිබෙන නොම්මර 11 රා තැබෑරුම.
3. මහවෙල වසමේ මායිම්තුළ තිබෙන නොම්මර 19 රා තැබෑරුම.
4. යටවත්තේ වසමේ මායිම්තුළ තිබෙන නොම්මර 20 රා තැබෑරුම.

මාතලේ නැගෙණහිර පලාත.

1. උඩගම වසමේ මායිම්තුළ තිබෙන නොම්මර 29 රා තැබෑරුම.

---

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.